# පුංචි කුරුළු පැටියා



එච්. එම්. සෙනුදි දම්සාරා හේරත්

# පුංචි කුරුළු පැටියා

**එච්. එම්. සෙනුදි දම්සාරා හේරත්**

**කෘතිය පළ කරන දිනය - 2025-01-17**

ISBN 978-624-208-274-5

# පිදුම

නව ලොවට පියනගන්නට

අත්වැල් සැපයූ

ආදරණීය ගුරු මෑණිවරුන්ටත්

ගුරු පියවරුන්ටත්,

මාගේ ආදරණීය දෙමව්පියන්ටත්

පිරිනමමි සෙනෙහසින්

මාගේ මෙම පළමු වෑයම......

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



# පුංචි කුරුළු පැටියා

එකෝමත් එක කාලෙක පුංචි කුරුළු පවුලක් ජීවත් වුණා. ඒ පවුලේ කුරුළු පැටව් තුන්දෙනෙක් හිටියා. හරිම දඟකාරයි. එත් පුංචි කුරුළු පැටියා නම් හරිම බයයි. සුළඟට කූඩුව සෙළවෙන කොටත් එයා ඇඬුවා.

හැමෝම පුංචි පැටියා ධෛර්යමත් කළා. ඒත් එයාගේ හිත හරිම දුර්වලයි. අඬමින් තමයි කූඩුවට වෙලා හිටියේ.




පැටව් දවසින් දවස ලොකු වුණා. "ඔයාලට අද ඉගිලෙන්න ඉගෙන ගන්න පුළුවන් " අම්මා කිව්වා. ලොකු පැටව් දෙන්නා හරිම ආසාවෙන් ඉගිලෙන්න යන්න ලෑස්ති වුණා. ඒත් පුංචි කුරුළු පැටියා නම් සෙළවුණේ වත් නෑ. "මට බෑ අද ඉගිලෙන්න එයා කිව්වා."



කුරුළු අම්මා කතා කළත් පුංචි කුරුළු පැටියා ඉගිළෙන්න ගියේ නෑ. ලොකු පැටව් දෙන්නා විතරක් ආසාවෙන් ඉගිළෙන්න ගියා. එයාලා ආයේ කූඩුවට ආවේ හොඳටම හවස් වෙලා.



අම්මා ඊළඟ දවසෙත් ඉගිළෙන්න පුරුදු කරා. ඒත් පුංචි පැටියා එදත් ඉගිළෙන්න ගියේ නෑ. අම්මා කොච්චර බය නැති කලත් එයා ඉගිළෙන්න ගියේ නෑ.




තුන්වෙනි දවසෙත් අම්මා පැටව් තුන් දෙනාට ඉගිළෙන්න කතා කළා. ලොකු පැටව් දෙන්නා තනියම ඉගිළිලා ගියා. ඒත් එදත් පුංචි පැටියා නම් ඉගිළෙන්න ගියේ නෑ. අම්මාට හොඳටම තරහා ගියා. "ඔයා හැමදාම කූඩුවටම වෙලා ඉන්න" අද මම ඔයාට කෑම ගේන්නෙත් නෑ බඩගින්නේ ඉන්න" කියලා අම්මා ඈතට ඉගිළිලා ගියා.



පුංචි පැටියාට හොඳටම බඩගිනියි. හවස් වුණාත් අම්මයි තාත්තයි අයියලා දෙන්නයි ආවේ නෑ. පුංචි පැටියා කූඩුවේ තනි වුණා. එයා බයෙන් බයෙන් වටපිට බැලුවා.



ටික වෙලාවකින් ගහේ අත්ත හෙළවෙනවා පැටියට දැනුණා. එයා බය වෙලා කුඩුවෙන් ඉස්සිලා බලනකොට දිග ගැරඬියෙක් කූඩුව ළඟටම එනවා දැක්කා.



පුංචි පැටියා ගොඩක් බය වුණා. පවුලේ අයට කෑගහලා කිව්වා. ඒත් කාටවත්ම ඇහුණේ නෑ. ගැරඩියා තව තවත් ළඟට ආවා. පැටියා ගොඩක් බය වුණා. අවසානයේ පැටියා කූඩුවෙන් එළියට පැන්නා. අත්තටු ගැහුවා. පැටියා ඉගිළිලා ඈතට ගියා.



අම්මයි තාත්තයි දැක්කා පුංචි පැටියා ඉගිළෙනවා. හැමෝටම හරිම සතුටුයි. අම්මා පුංචි පැටියා ළඟට ඇවිත් මෙහෙම කිව්වා. "දෙයක් කරන්න කවදාවත් බය වෙන්න එපා. උත්සාහ කරලා බලන්න" කියලා පුංචි කුරුළු පැටියාටත් හරිම සතුටුයි.

හැමෝම ඒ මේ අත ඉගිළෙමින් සතුට සැමරුවා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්